# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/52 - 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2023.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 94/47 (VIII) (A)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ශාන්ති විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ශාන්ති විහාරය සඳහා පරිබාහිර සැලැස්මක් සකස්කළ යුතු බවට විධාන කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

### *ශාන්ති විහාරය සංයුක්ත වන භූමි ප්‍රදේශය*

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නො. 31J පුල්මුඩේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (අංක 04) පුල්මුඩේ ග්‍රාමයේ පිහිටි වරහුතුරායි නමැති ඉඩම්වලට සර්වේයර් ජනරාල්ගේ 2019 සැප්තැම්බර් මස 30 වැනි දිනැති අංක එෆ්ටීපී 12 (FTP 12) දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1472 (හෙක්ටයාර 15.5097), කැබලි අංක 1475 (හෙක්ටයාර 4.7119), කැබලි අංක 1476 (හෙක්ටයාර 19.4422), කැබලි අංක 1397 (හෙක්ටයාර 0.7568) වලින් සමන්විත හෙක්ටයාර 40.4206 ක විශාලත්වයෙන් යුක්ත පහත සඳහන් පරිදි මායිම් වූ සම්පූර්ණ භූමි ප්‍රදේශයː-

**කැබලි අංක 1472 - වරහුතුරායි ඉඩම**

| | | |
|---|---|---|
| *උතුරට* | ː | කැබලි අංක 1477 |
| *නැගෙනහිරට* | ː | කැබලි අංක 1477 සහ 1473 |
| *දකුණට* | ː | කැබලි අංක 1473 සහ 1477 |
| *බටහිරට* | ː | කැබලි අංක 1477 |

**කැබලි අංක 1475 - වරහුතුරායි ඉඩම**

| | | |
|---|---|---|
| *උතුරට* | ː | කැබලි අංක 1474 සහ 1477 |
| *නැගෙනහිරට* | ː | කැබලි අංක 1477, 1181 සහ 1182 |
| *දකුණට* | ː | කැබලි අංක 1181, 1182 සහ 1476 |
| *බටහිරට* | ː | කැබලි අංක 1476 සහ 1474 |

**කැබලි අංක 1476 - වරහුතුරායි ඉඩම**

| | | |
|---|---|---|
| *උතුරට* | ː | කැබලි අංක 1474, 1397 සහ 1475 |
| *නැගෙනහිරට* | ː | කැබලි අංක 1475, 1182 සහ 1477 |
| *දකුණට* | ː | කැබලි අංක 1477 |
| *බටහිරට* | ː | කැබලි අංක 1474 සහ 1397 |

**කැබලි අංක 1397 - වරහුතුරායි ඉඩම**

| | | |
|---|---|---|
| *උතුරට* | ː | කැබලි අංක 1474 සහ 1476 |
| *නැගෙනහිරට* | ː | කැබලි අංක 1476 |
| *දකුණට* | ː | කැබලි අංක 1476 |
| *බටහිරට* | ː | කැබලි අංක 1476 සහ 1474 |

EOG 08-0170

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.